# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2196/57 - 2020 ඔක්තෝබර් මස 10 වැනි සෙනසුරාදා - 2020.10.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ යටවත්ත ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන යටවත්ත ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ යටවත්ත ප්‍රාදේශීය සභාවට තෝරාඑවා ඇති සභිකයෙකු ලෙස පත් වූ යටවර ගෙදර විජිත බංඩාර දොරකුඹුර අයත් වන්නා වූ ස්වාධීන කණ්ඩායමේ නායකට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නා වූ ද, එම යටවත්ත ප්‍රාදේශීය සභාවට තෝරාඑවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී ස්වාධීන කණ්ඩායම් නායක විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සිත්තයියා සවුන්දරනායගම් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

යටවත්ත ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, ප්‍රතාපසිංහ ආරච්චිගේ කුමරිනී දසන්ති වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් සිත්තයියා සවුන්දරනායගම්, යටවත්ත ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**පී. ඒ. කේ. දසන්ති,**
තේරීම්භාර නිලධාරි,
යටවත්ත ප්‍රාදේශීය සභාව.

2020 ඔක්තෝබර් මස 09 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මාතලේ.

1A - G 32822 — 30 (2020/10)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*